# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය

②

## විෂයානුබද්ධ පුනරීක්ෂණ සංචිතය
## 10 ශ්‍රේණිය
## ව්‍යාපාර පරිසරය

01. ව්‍යාපාර පරිසරය යන්න වඩාත් හොඳින් අර්ථ දැක්වෙන වරණය වන්නේ,
    (1) ව්‍යාපාරය හා එය අවට වටපිටාවයි.
    (2) ව්‍යාපාරය ක්‍රියාත්මක වන පරිසරයයි.
    (3) ව්‍යාපාරය කරගෙන යාමේදී ඊට බලපෑම් ඇති කරන සාධක ඇතුළත් පරිසරයයි.
    (4) ව්‍යාපාරයකට පාලනය කළ හැකි සාධක ඇතුළත් පරිසරයයි.

02. ව්‍යාපාරයක බාහිර පරිසරය අධ්‍යයනය කිරීමෙන් ව්‍යාපාරයකට ලබාගත හැකි ප්‍රයෝජනයකි.
    (1) ව්‍යාපාරයට ලාභය වැඩි කර ගැනීමට හැකිවීම.
    (2) ව්‍යාපාරය පවත්වාගෙන යාමට පහසු වීම.
    (3) ව්‍යාපාරය පහසුවෙන් දියුණු කර ගැනීමට හැකිවීම.
    (4) පරිසරයේ සිදුවන වෙනස්කම්වලින් අවස්ථා හා තර්ජන හඳුනාගත හැකිවීම.

- කමල් රු. 100 000 ක ප්‍රාග්ධනයක් යොදා ව්‍යාපාරයක් ආරම්භ කළ අතර ව්‍යාපාරය සඳහා සේවකයෙක්ද බඳවා ගන්නා ලදී. ව්‍යාපාරයට විශාල ගනුදෙනුකරුවන් ප්‍රමාණයක් පැමිණි අතර සුදුසු සැපයුම්කරුවන් සොයා ගැනීම ඔහුට ගැටළුවක් බවට පත්ව ඇත.

03. ඉහත සිද්ධියේ සඳහන් අභ්‍යන්තර පරිසර සාධක පිළිවෙලින් ඇතුළත් පිළිතුර වන්නේ,

    I. අයිතිකරු, සැපයුම්කරුවන්
    II. අයිතිකරු, සේවකයන්
    III. ගනුදෙනුකරු, සැපයුම්කරුවන්
    IV. අයිතිකරු , ගනුදෙනුකරුවන්

04. ව්‍යාපාර සංවිධානයකට පාලනය කළ හැකි සාධක දෙක ඇතුළත් වරණය තෝරන්න.

    I. ගනුදෙනුකරුවන්, සැපයුම්කරුවන්
    II. ගනුදෙනුකරුවන්,අයිතිකරුවන්
    III. සැපයුම්කරුවන්, අයිතිකරුවන්
    IV. අයිතිකරුවන් , සේවකයන්

05. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකයක් ලෙස...........①........හඳුනාගත හැකි අතර, බාහිර පරිසර සාධකයක් ලෙස........②...........හඳුනාගත හැකිය. ① හා ②හිස්තැනට වඩාත් සුදුසු වරණය වන්නේ,

    I. කළමනාකරුවන්, තරඟකරුවන්
    II. තරඟකරුවන්, ගනුදෙනුකරුවන්
    III. තරඟකරුවන්, සැපයුම්කරුවන්
    IV. සේවකයන්, කළමනාකරුවන්

06. සංකල්පනී නිවසේදී ඉඳිආප්ප සකසා පාසලේ ආපනශාලාවට සැපයීම සිදු කරයි. ඇයගේ තරඟකරුවන් ලෙස සැළකිය හැකි ව්‍යාපාරය වන්නේ,

    I. පැණිබීම නිෂ්පාදනය කරන්නෙක්
    II. යෝගට් නිෂ්පාදනය කරන්නෙක්
    III. බේකරි කෑම නිෂ්පාදනය කරන්නෙක්
    IV. ඇඟළුම් නිෂ්පාදන ආයතනයක්

07. රජය විසින් 2022 වර්ෂය සඳහා අයවැය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී. අය වැය ප්‍රකාශය අයත්වන ව්‍යාපාර පරිසරය වන්නේ,

I. නෛතික පරිසරය
II. දේශපාලන පරිසරය
III. ආර්ථික පරිසරය
IV. තාක්ෂණික පරිසරය

08. රජය විසින් ව්‍යාපාරවලට නීතිරීති පැනවීමේ ප්‍රධාන අරමුණු වන්නේ,

A. පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම.
B. සමාජය ආරක්ෂා කිරීම.
C. පරිසරය ආරක්ෂා කිරීම.
D. දේශීය ව්‍යාපාරිකයන් ආරක්ෂා කිරීම.

I. A පමණක් නිවැරදිය II. B පමණක් නිවැරදිය III. C පමණක් නිවැරදිය IV. ඉහත සියල්ල නිවැරදිය

09. 2003 අංක 09 දරණ පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරි පනත පිහිට වූයේ ......①...... වන අතර, ඒ සඳහා ......②......පිහිටුවා ඇත.
① හා ② හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර පිළිවෙලින් දැක්වෙන වරණය,

I. පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීමට, පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
II. නිෂ්පාදනය ආරක්ෂා කර ගැනීමට, ප්‍රමිති ආයතනය
III. පරිසරය ආරක්ෂා කර ගැනීමට, මධ්‍යම පරිසර අධිකාරිය
IV. පාරිභෝගිකයා ආරක්ෂා කර ගැනීමට, මහජන සෞඛ්‍ය පරීක්ෂක

10. තාක්ෂණික පරිසරය නිසා අතීතයේ ව්‍යාපාර පවත්වාගෙන ගිය ආකාරයට වඩා වෙනත් ආකාරයට වර්තමානයේ ව්‍යාපාර කටයුතු කරගෙන යයි. I කොටසෙන් අතීතය ද II කොටසෙන් වර්තමාන ව්‍යාපාර කටයුතු ද දැක්වේ. ඒ අනුව පිළිවෙලින් ගැලපෙන වරණය තෝරන්න.

| I | II |
|---|---|
| ✱ පොත්වල තැබූ ගිණුම් | A විද්‍යුත් මුදල් |
| ✱ කාසි හා නෝට්ටු | B පරිගණක මෘදුකාංග |
| ✱ මිනිස් ශ්‍රමය | C වෙබ් අඩවි |
| ✱ පෝස්ටර්, අත් පත්‍රිකා | D රොබෝවරු |

I. A,B,C,D II. C,B,A,D III. B,A,D,C IV. D,C,B,A

11. ආර්ථික පරිසර සාධක පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

I. අයවැය, පොලී අනුපාතය, ජනගහනය, ආනයන
II. පොලී අනුපාතය, උද්ධමනය, ආදායම් ව්‍යාප්තිය, ඉතුරුම්
III. වැඩිහිටි දීන, රැකියා නියුක්තිය, විනිමය අනුපාතය, උද්ධමනය
IV. අපනයන, ළමා දීන, යන්ත්‍ර සූත්‍ර, රොබෝවරු

12. ශ්‍රී ලංකා මහ බැංකුව ණය සඳහා අයකළ පොලී අනුපාතය 9% සිට 7% දක්වා පහත හෙලන ලදී. මෙමඟින් ව්‍යාපාරවලට සිදුවන බලපෑම වන්නේ,

I. ව්‍යාපාර විසින් ඉතුරුම් ඉහල නැංවීම
II. ණය ගැනීමේ පිරිවැය ඉහළ යාම.
III. ණය ගැනීමට පෙළඹීම.
IV. ව්‍යාපාර විසින් ණය ගැනීම සීමාවීම.

13. රටෙහි සමස්ත භාණ්ඩ හා සේවාවල මිල ගණන් අඛණ්ඩව ඉහළ යාම.....①........ලෙස හඳුන්වන අතර, පුද්ගලයන් තම ආදායමෙන් වැය නොකර තබාගන්නා කොටස.....②........ලෙස හඳුන්වයි.

① හා ② හිස්තැනට වඩාත් ගැලපෙන පිළිතුර ඇතුළත් කාණ්ඩය වන්නේ,

I. ආදායම් ව්‍යාප්තිය, ඉතුරුම් II. ආදායම් ව්‍යාප්තිය, උද්ධමනය
III. ඉතුරුම්, උද්ධමනය IV. උද්ධමනය, ඉතුරුම්

14. 1 කොටසෙන් ආර්ථික පරිසර සාධකද 11 කොටසෙන් ඉන් ඇතිවන බලපෑම ද දක්වයි. පිළිවෙලින් ගැලපෙන වරණය තෝරන්න.

| I | II |
|---|---|
| 1. ඉතුරුම් ඉහලයාම | A ජීවන තත්ත්වය පහත වැටෙයි. |
| 2. උද්ධමනය ඉහලයාම | B ආයෝජනය සඳහා අරමුදල් ලැබේ. |
| 3. රුපියල අවප්‍රමාණය වීම | C විදේශ වෙළෙඳපොල අවස්ථා ලැබෙයි. |
| 4. ජාත්‍යන්තර ගිවිසුම් | D ආනයන වියදම ඉහළ යයි. |

I. B,A,D,C II. A,B,D,C III. B,D,C,A IV. D,C,A,B

15. ගෝලීයකරණය යනුවෙන් අදහස් වන්නේ,
   I. රටක තාක්ෂණික ක්‍රමවේද අනුගමනය කරමින් කරනු ලබන වෙළෙඳාමය.
   II. වාණිජ කටයුතුවලට නවීන තාක්ෂණික මෙවලම් භාවිතා කිරීමයි.
   III. භාණ්ඩ හා සේවා, ප්‍රාග්ධනය ආදිය බාධාවකින් තොරව හුවමාරු කරගැනීමයි.
   IV. ලෝකයේ රටවල් අතර ආර්ථික. සමාජීය හා සංස්කෘතික වශයෙන් ඇති අන්‍යෝන්‍ය බැඳීමය.

16. දේශීය ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑමක් නොවන්නේ,
   I. දැඩි තරඟකාරීත්වයකට මුහුණදීමට සිදුවීම.
   II. නවීන තාක්ෂණය ලබාගත හැකිවීම.
   III. ගුණාත්මක විදේශ අමුද්‍රව්‍ය ලබාගත හැකිවීම.
   IV. විදේශ ප්‍රාග්ධනය රට තුළට ගලා ඒම.

17. දේශීය අර්තාපල් වගාවට අවශ්‍ය බීජ වර්ග පකිස්තානයෙන් ආනයනය කළ අතර, අර්තාපල් අස්වැන්න ලැබෙන කාලය වන විට අර්තාපල් තොග වශයෙන් ආනයනකරුවන් රටට ආනයනය කර තිබිණි. ඉහත සිද්ධියේ දේශීය අර්තාපල් නිෂ්පාදකයන්ට බීජ අර්තාපල් ආනයනය කිරීම......①........ වන අතර, අර්තාපල් ආනයනය .......②........වේ.

I. අවාසිදායක, වාසිදායක තත්ත්වයක්. II. වාසිදායක, අවාසිදායක තත්ත්වයක්.
III. වාසිදායක , වාසිදායක තත්ත්වයකි. IV. අවාසිදායක, අවාසිදායක තත්ත්වයකි.

පහත සිද්ධිය ඇසුරෙන් 18,19,20 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- රජය විසින් අඩු පොළියට ලබාදුන් ණය පහසුකම ලබාගෙන සුලේකා ගාල්ල කොළඹ අධිවේගී පිවිසුම් මාර්ගය අසල "හෙළරස" නමින් පැරණි ගැමි කෑම නිෂ්පාදනය කර අලෙවි කරන ආයතනයක් ආරම්භ කළ අතර, ඒ සඳහා ඇයට දක්ෂ සේවිකාවක් ද සම්බන්ධ කර ගැනීමට හැකිවිය. පසුව තවත් එවැනිම ව්‍යාපාරයක් ඇයගේ මිතුරියක් විසින් ඒ ආසන්නයේම ආරම්භ කරන ලදී.

18. "හෙළරස" ව්‍යාපාරය අධිවේගී මාර්ගය අසල ආරම්භ කිරීම ව්‍යාපාරයට
   I. ශක්තියකි II. අවස්ථාවකි III. තර්ජනයකි. IV. දුර්වලතාවයකි.

19. "හෙළරස" ව්‍යාපාරයට එල්ලවිය හැකි තර්ජනයක් වන්නේ,

I. තවත් එවැනිම ව්‍යාපාරයක් ඒ අසල ආරම්භ කිරීම.
II. ව්‍යාපාරයේ සේවිකාව සේවයෙන් අස්වීම.
III. අමුද්‍රව්‍ය සැපයුම්කරුවන් සුලභ වීම.
IV. ගමේ කෑම සඳහා ඉහළ ඉල්ලුමක් ඇතිවීම.

20. දක්ෂ සේවකයෙකු සේවයේ නිරත වීම ව්‍යාපාරයට ......①........ වන අතර, බැංකු විසින් අඩු පොළියට ණය සැපයීම ව්‍යාපාරයට.......②....... වේ. ① හා ② හිස්තැනට වඩාත් ගැළපෙන පිළිතුර ඇතුළත් වරණය වන්නේ,

I. තර්ජනයක්, ශක්තියක්.
II. ශක්තියක් , දුර්වලතාවයක්.
III. ශක්තියක්, අවස්ථාවක්.
IV. තර්ජනයක්, දුර්වලතාවයක්.

21. පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

I. ව්‍යාපාර කටයුතු කරගෙන යාමේදී ඊට බලපෑම් ඇති කරන සාධක ඇතුළත් පරිසරය ව්‍යාපාර පරිසරයයි. (.......)
II. ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර පරිසරය ලෙස කොටස් 2 කට බෙදේ. (.......)
III. ගනුදෙනුකරුවන් අභ්‍යන්තර පරිසර සාධකයකි. (.......)
IV. ව්‍යාපාරයකට අවශ්‍ය සම්පත් සපයන පුද්ගලයන් අයිතිකරුවන් ලෙස හඳුන්වයි. (.......)
V. යම්කිසි ව්‍යාපාරයක භාණ්ඩ හා සේවාවලට සමාන භාණ්ඩ හෝ සේවා නිෂ්පාදනය කරන ආයතන තරඟකරුවන් වේ. (.......)
VI. ගෝලීය පරිසරය ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධකයකි. (.......)
VII. යටිතල පහසුකම් සංවර්ධන ප්‍රතිපත්තිය දේශපාලන පරිසරයට අයත්ය. (.......)
VIII. රජය විසින් පනවනු ලබන නීති ක්‍රියාත්මක කිරීම සඳහා විවිධ ආයතන, මණ්ඩල ක්‍රියාත්මක වේ. (.......)
IX. නව සොයා ගැනීම හා නව නිර්මාණකරණය තාක්ෂණික පරිසරයට අයත් නොවේ. (.......)
X. වෙළෙඳ කලාප, වෙළෙඳ ගිවිසුම් යනාදිය ජාත්‍යන්තර සබඳතා යන්නට අයත්ය. (.......)
XI. යම් රටක මුදල් ඒකකයක් තවත් රටක මුදල් ඒකකයක් සමඟ හුවමාරු වන අනුපාතය විනිමය අනුපාතයයි. (.......)
XII. නවීන තාක්ෂණය ලබාගැනීමට හැකිවීම ගෝලීයකරණයෙන් ඇති වූ අවාසියකි. (.......)
XIII. ගෝලීයකරණයේදී භාණ්ඩ හා සේවා ශ්‍රමය, ප්‍රාග්ධනය යනාදිය බාධාවකින් තොරව හුවමාරු වේ.(.......)
XIV. දේශීය ව්‍යාපාරවල පැවැත්ම අස්ථාවර වීම සඳහා ගෝලීයකරණය බලපෑම් ඇති කරයි. (.......)
XV. දැඩි තරඟකාරීත්වයකට මුහුණු දීමට සිදුවීම ව්‍යාපාරයකට තර්ජනයකි. (.......)
XVI. ව්‍යාපාර පරිසරයේ දැකිය හැකි අවාසිදායක තත්ත්වයන් දුර්වලතාවයන්ය. (.......)
XVII. අභ්‍යන්තර පරිසරයේ දැකිය හැකි අවාසිදායක තත්ත්වයන් ශක්තීන්ය. (.......)
XVIII. බාහිර පරිසරයේ ඇති වාසිදායක තත්ත්වයන් අවස්ථාවන්ය. (.......)
XIX. තාක්ෂණික දැනුම යාවත්කාලීන නොවීම ව්‍යාපාරයට ශක්තියකි. (.......)
XX. ව්‍යාපාර සඳහා බදු සහන ලබාදීම ව්‍යාපාරයට අවස්ථාවකි. (.......)

22. I. ව්‍යාපාර පරිසරය නිර්වචනය කරන්න.
II. ව්‍යාපාර පරිසරය ගැලීම් සටහනකින් දක්වන්න.
III. අභ්‍යන්තර පරිසරය යනු කුමක්ද?
IV. බාහිර පරිසරය යනු කුමක්ද?

23. සිරිපාල විසින් ඉන්දියාවේ සිට කහ ගෙන්වා ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල අලෙවි කරනු ලබයි. නමුත් රජය විසින් කහ ආනයනය තහනම් කරන ලද අතර දේශීය නිෂ්පාදකයන් දිරිගැන්වීමට කටයුතු කරන ලදී.
    I. ඉහත සිද්ධියේ සඳහන් බාහිර පරිසර සාධකයක් දක්වන්න.
    II. කහ ආනයනය තහනම් කිරීම තුළින් දේශීය ව්‍යාපාරවලට හිතකර බලපෑම් දෙකක් දක්වන්න.

24. චීනයේ වූහාන් නගරයේ ආරම්භ වූ කොවිඩ් 19 වෛරසය ලංකාව තුළද සීඝ්‍රයෙන් ව්‍යාප්ත විය.
    I. ඉහත සිද්ධිය ඇතුළත් බාහිර පරිසර සාධකය කුමක්ද?
    II. කොවිඩ් 19 වෛරසය තුළින් ඉහත ඔබ සඳහන් කළ බාහිර පරිසර සාධකය නිසා දේශීය ව්‍යාපාර සඳහා ඇතිවූ අහිතකර බලපෑම් 2 ක් දක්වන්න.

25. ව්‍යාපාර පරිසරය අභ්‍යන්තර හා බාහිර පරිසරය ලෙස කොටස් දෙකකට දැක්විය හැකිය.
    I. ව්‍යාපාර අභ්‍යන්තර පරිසරය තුල පවතින ශක්තියක් හා දුර්වලතාවයක් දක්වන්න.
    II. ව්‍යාපාර පරිසරයේ බාහිර පරිසරය තුළ පවතින අවස්ථාවක් හා තර්ජනයක් දක්වන්න.

26.
    I. ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යාමේදී බලපෑම් ඇතිවීමට තුඩුදෙන ආර්ථික පරිසර සාධක දෙකක් දක්වන්න.
    II. ඉහත ඔබ සඳහන් කළ ආර්ථික පරිසර සාධක දෙක පැහැදිලි කරන්න.

27. නෛතික පරිසරය තුළ රජය විසින් පාර්ශ්ව තුනක් ආරක්ෂා කිරීමට නීති රීති පනවා ඇත.
    I. එම පාර්ශ්ව තුන සඳහන් කරන්න.
    II. ඉහත ඔබ සඳහන් කළ පාර්ශ්ව තුන ආරක්ෂා කිරීමට සම්මත කළ අණ පනත් හා නීති රීති 3ක් දක්වන්න.
    III. එම නීති ක්‍රියාත්මක කිරීමට පනවා ඇති තනතුරු හා ආයතන 2 බැගින් දක්වන්න.

28. නව සොයාගැනීම් හා නව නිර්මාණ ආදිය නිසා තාක්ෂණික පරිසරය සීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවතී.
    I. තාක්ෂණික පරිසරය සීඝ්‍රයෙන් වෙනස්වීමට බලපෑ හේතු 2 ක් දක්වන්න.
    II. තාක්ෂණික වෙනස්වීම් නිසා ව්‍යාපාරවල සිදු වූ වෙනස්කම්වලට නිදසුන් 2 ක් දක්වන්න.

29. යම් රටක මුදල් ඒකකයක් තවත් රටක මුදල් ඒකකයක් සමඟ හුවමාරු වන අනුපාතය විදේශ විනිමය අනුපාතය වේ.
    I. විදේශ විනිමය අනුපාතය කුමන බාහිර පරිසර සාධකයට අයත්ද?
    II. පහත සඳහන් විදේශ මුදල් ඒකක වල වර්තමාන හුවමාරු අනුපාතය ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වන්න.
        - ඇමරිකානු ඩොලරය
        - බ්‍රිතාන්‍ය පවුම
        - ජපන් යෙන්
        - ඉන්දියානු රුපියල්
        - යූරෝ

30.
    I. ගෝලීයකරණය යනු කුමක්ද?
    II. ගෝලීයකරණය හේතුවෙන් දේශීය ව්‍යාපාර සඳහා ඇතිකරන හිතකර බලපෑම් 2 ක් දක්වන්න.

31.

I. ව්‍යාපාර පරිසරය අධ්‍යයනය කිරීමෙන් ව්‍යාපාරයකට ඇති වැදගත්කම දක්වන්න.

II. ව්‍යාපාරයක දැකිය හැකි ශක්තීන්, දුර්වලතා, අවස්ථා, තර්ජන එක බැගින් දක්වන්න.

32. යම් රටක රජයක් විසින් ආර්ථික කටයුතු මෙහෙයවීමේදී විවිධ ප්‍රතිපත්ති අනුගමනය කරයි.

I. ඉහත සිද්ධියේ සඳහන් පරිසර සාධක මොනවාද?

II. රටක රජයක් ආර්ථික කටයුතු මෙහෙයවීමට අනුගමනය කරන ප්‍රතිපත්ති දෙකක් දක්වන්න.

33.

I. උද්ධමනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

II. ආදායම් ව්‍යාප්තිය යන්න හඳුන්වන්න.

III. රැකියා නියුක්තිය යනු කුමක්ද? පූර්ණ රැකියා නියුක්තිය හඳුන්වන්න.